# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/58 - 2016 මාර්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2016.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 1964 අංක 28දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: MO/KTG/LND/03/AQSTN/2012/02.

ඉඩම් අමාත්‍යාංශයේ අංක:4/3/2/2012/ඒ එස්/316.

යාල ජාතික වන උද්‍යානය තුළ ඇති පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්පත් කර ගැනීමේ පණතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය* :-

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කතරගම ගමේ පිහිටි මොනරාගල මැණුම් අධිකාරි විසින් පිළියෙල කර ඇති හූ.මු. පි. 25, පත්‍ර අංක පී. 3/31, 32, 39, 40 හි දැක්වෙන ඉඩම් කැබලි.

1. **කැබලි අංක** 1A

ඉඩමේ නම: කුඹුරුකැලේ; හිමිකම් කියන අය: රුහුණු මහා කතරගම දේවාලය, කතරගම; ප්‍රමාණය: හෙක්. 179.7566

1. කැබලි අංක 1B

ඉඩමේ නම: කුඹුරුකැලේ; හිමිකම් කියන අය: රුහුණු මහා කතරගහ දේවාලය, කතරගම; ප්‍රමාණය: හෙක්. 24.0991

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පැවරූ අයවලුන් හෝ 2016 මැයි මස 25 වැනි දින පෙ. ව. 10.00 ට කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 මැයි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම අත්කර ගැනීම සඳහා වන්දි මුදල් ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත්, පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

එස්. සී. වීරකෝන්,
ප්‍රාදේශීය ලේකම්.
කතරගම.

2016 මාර්තු මස 28 වැනි දින,
කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 677